# නව සිය වසක සතු රැකියාවල නියම තතු

ගත කරන සිය වසට වඩා එළඹෙන සිය වස සුව පහසු වනු ඇත. දැනටමත් විසි එක් වැනි ශතවර්ෂය පිළිබඳ විවිධ අනාවැකි වලින් ඔබේ සවන් පිරෙමින් පවතී යැයි මට සිතේ. කෙසේ වෙතත් නව විද්‍යාත්මක පරිසරය මත ඇදහිය නොහැකි අනාවැකිවලට මුහුණ දීමට ඔබට සිදු වෙනු නිරනුමාන ය. සාගර උණුසුම් වී බුබුලු දමනු ඇත. පෘථිවිය සේදී යමින් ගංගා ලේ වමනය කරනු ඇත. සැබැවින් ම එවැනි අනාවැකි ඔබේ කුතුහලයට වඩා විස්මයට හේතු වනු ඇත. ඔබ ඒවා නොඅදහන බව, විශ්වාස නොකරන බව මම දනිමි. බහු භාණ්ඩික සමයක වෙසෙන ඔබගේ නිවස විවිධ පරිභෝග උපභෝග භාණ්ඩවලට ගබඩාවක් වනු නිසැක ය. එළය සහල් පමණක් නොව හරිකේන් ලන්තැරුම් ද ඒ අතර වනවාට කිසිදු සැකක් නැත. එසේ වුවත් සහස්‍රකය ආරම්භයේ දී ම මම එක් වැදගත් ප්‍රශ්නයක් අසමි. එනම් කිසියම් රැකියාවක් අපේක්ෂාවෙන් ඔබට කවර තරම් නම් කාලයක් සිටිය හැකිවේද යන්නයි.

අප සියලු දෙන ම කනගාටුවට ඇද දමන කරුණක් නොවෙන සහස්‍රයේ දී ආරම්භ වී තිබේ. ලෝක ආර්ථිකය කාර්මික විප්ලවය විසින් දැවැන්ත පරිවර්තනකයට ඇද දමනු ලැබ තිබේ. වැඩ කරන ජනතාව ලෝකය උඩු යටිකුරු කරන තෙක් එළඹෙන සහස්‍රය නොදැන සිටියහ. කනගාටුවට එකම හේතුව එයයි. මිනිසා වෙනුවට රොබෝවරු බිහිව ඇත. අනාගතයේ රොබෝ සංස්කෘතියක් නිසැක ලෙස ම බිහිවනු ඇත. පරිගණක තාක්ෂණය මිනිස් සිත ද අභිභවනය කරන දිනය දුර ඇත නොවේ. සියලු මානව හරයයන් එමගින් පාලනය කැරෙනු ඇත. යම් ක්ෂේත්‍රයක නියැලී ඇති විශේෂඥයන්ගේ දැනුම් සම්භාරය සී. ඩී. තැටියක නිමග්න වෙමින් පවතී. ඇමරිකානු "Cubicle" වැඩ සටහනට අනුව නම්‍යශීලී වැඩ කරන පැය ගණන තාවකාලික කොන්ත්‍රාත්තු සහ දුරකතන ජාලා සන්නිවේදනය හා බද්ධවනු ඇත.

ආසියාව මෙම අර්බුදය තුළ සිරවී සිටී. ඔවුන්ගේ හුරු පුරුදු ආර්ථික ප්‍රවණතා වෙනස්තාවකට බඳුන් වෙතැයි සිතිය හැකි නොවේ.

**ජීවිතාන්තය දක්වා සේවය කිරීම නම් සංකල්පය විවිධ කේෂ්ත්‍රයන්හි සම්ප්‍රදායානුකූල බව වෙනස්වීම නිසා ඇහිරී යනු ඇත. පුළුල් ව කල්පනා කිරීමේ දී රැකියාවකට සුදුසු පුද්ගලයා යන්න ද අර්ථ කථනය කිරීමට සිදුවනු ඇත. මේ අනුව රාජ්‍ය සංස්ථාවල ද රැකියාවක් සොයා ගැනීම අපහසු වනු නිසැක ය.**

මෙම ආර්ථික අවපාතිය වේගය සේවා වියුක්තතාව කෙරේ දැඩිව බලපානු ඇත. මෙසේ සඳහන් කරනු ලබන්නේ ඉන්දුනීසියානු ආර්ථික න්‍යායවාදියකු වන ග්‍රේග් ඩොයලි ය. විශ්ව කළමනාකරණ ඇමරිකානු ව්‍යවසාය උපදේශක ආයතනයක් වන Hewitt සංගමය ද ඒ බව අනුමත කරයි. මෙයට පෙර අතීතයේ දී කායික ශ්‍රමය යෙදවූ මිනිසා තමන්ට රිසිසේ වැඩ කළේ ය. අද යන්ත්‍රනය හා පබැඳුණු වේගයේ ද ඔවුහු කනස්සල්ලට පත් ව සිටිති. සැබැවින් ම යන්ත්‍රනය පහළ වූයේ ඔහුගේ ජීවන කටයුතු පහසු කරනු පිණිස ය. මේ අනුව සේවාදායකයින් පෙරට වඩා පුළුල් අයුරින් සිතිය යුතුව ඇත. මට පෙනෙන අන්දමට පහත සඳහන් ක්‍රියාදමයන් හා ධුරාවලිය වැඩිකල් නොපවතිනු නොඅනුමාන ය.

1. රාජ්‍ය සංස්ථා අර්ථවත් ප්‍රතිඵල මත රඳා පවතිනු සඳහා වඩාත් සුදුසු නිලධාරි මණ්ඩලයක් යෙදවනු ඇත.

2. ආසියාව සේවිය භාණ්ඩ නිෂ්පාදනය තමන් විසින්ම කරගනු ලැබෙනු ඇත.

3. එසේ වුවද ආර්ථික හා වාණිජ කේෂත්‍රවල පවතින වේගය වෙනත් ආයතනවල එළදැසිතාව වැඩි කිරීමට බලපානු ඇත.

4. කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනයට වසර දෙකක් වැනි කලක් ගතවේ නම් එම ක්‍රමය අත්හැර දමනු නිසැක ය.

5. නව ව්‍යාපාර හා ව්‍යවසායක කළමනාකාර පන්තියක් නිරනුමානව ම බිහිවනු ඇත. පෞද්ගලික ව්‍යවසාය හා සම්බන්ධවන මෙම කළමනාකරන ක්‍රියාවලිය සිත් ඇදගන්නා සුළු එකක් වනු නොඅනුමාන ය.

සේවාදායකයන් ගේ සේවය බලහත්කාරයෙන් නොව ස්ව කැමැත්තෙන් ම ලබා ගැනීම සාර්ථක කළමනාකාරිත්වය ලෙස අර්ථ නිමනය කළ හැකි ය. ඇමරිකානු ජාතික සේවකයන් ලක්ෂ ගණනක ගේ රැකියා නූතන එසේත් නොවිණි නම් අති නවීන තාක්ෂණය නිසා අවදානම් තත්ත්වයකට දැනටමත් පත්ව තිබේ. ජීවිතාන්තය දක්වා සේවය කිරීම නම් සංකල්පය විවිධ කේෂ්ත්‍රයන්හි සම්ප්‍රදායානුකූල බව

වෙනස්වීම නිසා ඇහිරී යනු ඇත. පුළුල් ව කල්පනා කිරීමේ දී රැකියාවකට සුදුසු පුද්ගලයා යන්න ද අර්ථ කථනය කිරීමට සිදුවනු ඇත. මේ අනුව රාජ්‍ය සංස්ථාවල ද රැකියාවක් සොයා ගැනීම අපහසු වනු නිසැක ය. එසේම තම හැකියාවට අනුව රැකියා දඩයම් කිරීමේ දවසක් නව සියවසේ දී අත්විඳින්නට ඔබට ද සිදුවනු සැකක් නැත.

නූතන තාක්ෂණය තවත් කාලයක් ආසියානුවන් ගේ යහපත සඳහා ම පවතිනු ඇත. එය සේවා වියුක්තියට හේතු වෙතත් ප්‍රතික්ෂේප නොකෙරේ. ඇතැම්විට වෘත්තීන් විශාල වෙනස්වීම්වලට භාජනය වෙමින් පවතී. මෙයින් නිසැක ලෙස ම එම වෘත්තීන්ට හොඳ අනාගතයක් හිමි කරනු ඇත. ආසියානු දේශීය තාක්ෂණය හෙවත් ආසියානුවන් ගේ යෝග්‍ය තාක්ෂණය ගතානුගතිකව පවතින බැවින් දැඩි වගකීමෙන් ඔවුන් මිදේ. නව තාක්ෂණයට කටයුතු කිරීමට ඒ සම්බන්ධිත ප්‍රවීනයන් ඇවැසි වේ. මේ වැඩ පිළිවෙල යටතේ නව රැකියා අවස්ථා උදා කෙරේ. අන්තර්ජාල වෙබ් අඩවි සේවා කදිම නිදසුන් ය. පස්වසරකට පෙර W. W. W. කුතුහලයට කරුණක් විය. අද මෙම ලෝක ව්‍යාප්ත වෙබ්, ඇමරිකානු ආර්ථිකය විශාල ලෙස මෙහෙයවයි. ඒවා නව වෘත්තීන් හා සේවා බිහි කරයි. 1995 ට පෙර දක්නට නොලැබුණු අන්තර්ජාල මෙහෙයුම්කරු, අන්තර්ජාල මාධ්‍ය අධ්‍යක්ෂවරු, ව්‍යවසායිකවරු, ආර්ථික උපදේශකවරු හා අන්තර්ජාල නීතිඥවරු අද බිහිව සිටිති. නව සියවස ආසියානු වෘත්තීන්හි ස්වභාවය මඳක් විමසමු. ප්‍රතිවිමර්ශනය කරමු.



## ගුරුවරයා

ඔහු උගන්වන්නකුට වඩා පොලෙඹවන්නකු වෙයි. එසේ ම ඉගැන්වීමට ද සිදු වේ. තොරතුරු තාක්ෂණය නව සහස්‍රකයේ ප්‍රාග්ධනය වන බැවින් ඒ පිළිබඳ ඉගැන්වීමේ කුසලතාව ඔහු ලබා තිබීම මැනවි. චීනයේ හා ආසියාවේ අන් රටවල ද ජනතාව ගේ පෞද්ගලික කුසලතා, තාක්ෂණය හා මුසු කිරීම ගරු කාර්ය වනු ඇත. මේ නිසා යුධ වියදම් හා අධ්‍යාපන වියදම් ද ඉහළ මට්ටමක පවතී.

## සෞඛ්‍ය හා සබැඳි වෘත්තීන්

ජනගහන වර්ධනය සහ අධි පොහොසත් බව නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රය විවිධ වෘත්තීන්වල නියැලී අයගේ ආදායම් මට්ටම ඉහළ අගයක පවතී. මෙයට වෛද්‍යවරුන් හෙද හෙදියන් පමණක් නොව පෝෂ්‍යදායී ආහාර, විටමින් නිෂ්පාදකයන් ද ඇතුළත් වේ.

## මෘදුකාංග සංවර්ධනය

පරිගණක නිෂ්පාදන ක්‍රියාවලිය හා සැබැඳේ. ඉන්දියාව හැරුණු විට අන් ආසියාතික රටවල් ද යෝධ පිම් තබමින් මෙම වෘත්තිය අවස්ථාවට එළඹෙමින් සිටී. ඉන්දියාව මෙම ආක්‍රමණකාරී ආර්ථික රටාවෙන් මඳ සැනසුමක් ලබා ඇත.

## වෙබ් අඩවි පාලනය

දත්ත සමාලෝචනයෙන් ආරම්භ විය. පසුව දෛනික වානිජ ක්ෂේත්‍රයට ද පිවිසියේ ය. අලසකළ ජනතාව ම අන්තර්ජාලයට ආකර්ෂණය කර ගනිමින් සිටී.

## විකල්ප බලශක්ති ප්‍රවාහය

පොසිල ඉන්ධන වෙනුවට විකල්ප බල ශක්ති ප්‍රභවයන් පිළිබඳ අන්තර් ජාතික මට්ටමින් පරිගණකයන් ඇවැසි වේ. යොදා ගැනීමට අපේක්ෂා කරන නව විකල්ප විභව ශක්තීන් පරිසරයට අනනුකූල සාර්ථක ඒවා වීම වැදගත්. නවීන මෝටර් වාහන විදුලි බලයෙන් ද පසුව න්‍යෂ්ටික ශක්තියෙන් ද ධාවනය වනු ඇත.

## ජාන විද්‍යාඥයන්

ජීව විද්‍යා ක්ෂේත්‍රයේ නව ජාන විද්‍යාවට ඉහළ අගයක් පිරිනැමෙමින් ඇත. මානව රූපකරණය යන හිසින් මෙම ජාන වැඩසටහන දක්වේ. ජාන චිකිත්සකයන්, ජාන ඉංජිනේරුවන් සඳහා අනාගතයේ දී රැකියා වෙළෙඳපොළ විවෘත වනු ඇත.

## න්‍යෂ්ටික තාක්ෂණඥයන්

විසි වසරක කාලයක සිට පරමාණු බලශක්ති ක්ෂේත්‍රය ඇබෑර්තු දක්නා ලැබේ.

## ක්වාන්ටම් පරිගණක ඉංජිනේරු

2010 පමණ වන විට අප භාවිත කරනු ලබන පරිගණක තාක්ෂණය යල් පිනූ තත්ත්වයට පත්වනු ඇත. ඒ වෙනුවට ක්වාන්ටම් සංඛ්‍යාපාත විද්‍යුත්මක නව තාක්ෂණයට රැකියා අවස්ථා මතු වනු නිසැක ය.

## සංඛ්‍යාංක ආර්ථික විද්‍යාව

නව සංඛ්‍යාංක ආර්ථික ක්ෂේත්‍රයේ රැකියා බහුල වනු ඇත. නිෂ්පාදන පරිගණක ගත කිරීම තුළින් මේ කාර්ය සිදු වේ. නිෂ්පාදිත වන සියලු භාණ්ඩ නිර්මාණ ත්‍රිත්ව ප්‍රමිතිය බෙදා හැරීමට අදාළ කටයුතු ඇතුළු සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියම සංඛ්‍යාංක ආර්ථික විද්‍යාවෙන් පාලනය කෙරේ. එබැවින් මෙම නව ඩිජිටල් ඉකොනොමික් ක්ෂේත්‍රය රැකියා අපේක්ෂා කළ හැකි ය.

## ලේකම් කාර්යය

පෞද්ගලික සහකාර හෝ උප නිලධාරී සේවාව තවත් වෘත්තීය අංශයකි.

මෙය පෞද්ගලික මානව සහකාර ලේකම් තනතුර වෙයි.

නව සියවස තරුණයන් ගේ සියවස යැයි ඇලන් කී නම් ස්විස් ජාතික කවියා වරක සඳහන් කෙළේ ය.

පිරිපුන් තාරුණ්‍යයෙන් නව සියවස අරඹන්න. ඔබට රටක් පමණක් නොව ජය ගැනීමට ලෝකයක් ද ඇත. හැකි නම් අන්තරීක්ෂය කරා ද පියාසැරියක යෙදෙන්න. ❑

ඒෂියාවීක් ඇසුරෙනි

අනුවර්තනය
**කරුණාරත්න කුමාරපෙලි**